| | | |
|---|---|---|
| කෘෂි තාක්ෂණවේදය I<br>விவசாயத் தொழினுட்பவியல் I<br>Agro Technology I | 18 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** කෘෂි කර්මාන්තයේදී මෘදු සහ දෘඪ තාක්ෂණ ඒකාබද්ධ කිරීමකට සුදුසු උදාහරණයක් වනුයේ
(1) සී සෑම සඳහා ට්‍රැක්ටර භාවිතයයි.
(2) ඩ්‍රෝන භාවිතයෙන්, ස්වයංක්‍රීයව කුඹුරුවල භූගෝලීය සිතියම්කරණය කිරීමයි.
(3) ස්වාභාවික සංඝටක භාවිතයෙන් කෘෂි රසායන නිෂ්පාදනය කිරීමයි.
(4) පරිගණක ආශ්‍රිත මෘදුකාංග ආධාරයෙන් බිංදු ජල සම්පාදන ක්‍රමයක් නිර්මාණය කිරීමයි.
(5) මන්ත්‍ර ජප කිරීම වැනි ඇදහිලි ක්‍රම භාවිතයෙන් පළිබෝධ පාලනය කිරීමයි.

**2.** ව්‍යාපාර සංවිධානයක කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) භාවිත කිරීමේ මූලික අරමුණ වනුයේ
(1) නිෂ්පාදන ක්‍රියාවලින් ස්වයංක්‍රීය කිරීම ය.
(2) පාරිභෝගික සබඳතා පවත්වා ගැනීම ය.
(3) සේවා නියුක්තිකයන් පුහුණු කිරීමට පහසුකම් සැපයීම ය.
(4) තීරණ ගැනීම සඳහා අවශ්‍ය නිවැරදි තොරතුරු ලබාගැනීම ය.
(5) ලාභය උපරිම කිරීම ය.

**3.** දෘෂ්ටිය සහ පටක අලුත්වැඩියා කිරීම සඳහා උපකාරී වන ආහාරමය පෝෂක වනුයේ පිළිවෙළින්
(1) යකඩ සහ ප්‍රෝටීන් ය.
(2) කැල්සියම් සහ ලිපිඩ ය.
(3) කාබෝහයිඩ්‍රේට සහ විටමින් D ය.
(4) විටමින් A සහ ප්‍රෝටීන් ය.
(5) විටමින් C සහ කාබෝහයිඩ්‍රේට ය.

**4.** මානව පෝෂණය හා සම්බන්ධව නිර්දේශිත දෛනික පරිභෝජනය (RDI) වඩාත් හොඳින් විස්තර කරනුයේ සියලු ම සෞඛ්‍ය සම්පන්න පුද්ගලයින්ගේ.
(1) පෝෂණ අවශ්‍යතාව සැපිරීමට ප්‍රමාණවත් ඕනෑම පෝෂකයක දෛනික පරිභෝජන අගයේ සාමාන්‍යය ලෙස ය.
(2) පෝෂණ අවශ්‍යතාව සැපිරීමට ප්‍රමාණවත් අත්‍යවශ්‍ය පෝෂකයක දෛනික පරිභෝජන අගයේ සාමාන්‍යය ලෙස ය.
(3) පෝෂණ අවශ්‍යතාව සැපිරීමට ප්‍රමාණවත් අත්‍යවශ්‍ය නොවන පෝෂකයක දෛනික පරිභෝජන අගයේ සාමාන්‍යය ලෙස ය.
(4) පෝෂණ අවශ්‍යතාව සැපිරීමට ප්‍රමාණවත් මහා පෝෂකයක දෛනික පරිභෝජන අගයේ සාමාන්‍යය ලෙස ය.
(5) පෝෂණ අවශ්‍යතාව සැපිරීමට ප්‍රමාණවත් ක්ෂුද්‍ර පෝෂකයක දෛනික පරිභෝජන අගයේ සාමාන්‍යය ලෙස ය.

[දෙවැනි පිටුව බලන්න

5. නැවුම් කිරි නරක්වීමේදී ඇඹුල් රසය ඇතිවීමට ප්‍රධානත ම හේතුව වන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය වනුයේ
(1) බැසිලස් (*Bacillus*) විශේෂ ය.
(2) ක්ලොස්ට්‍රිඩියම් (*Clostridium*) විශේෂ ය.
(3) ලැක්ටොබැසිලස් (*Lactobacillus*) විශේෂ ය.
(4) සැකරොමයිසස් (*Saccharomyces*) විශේෂ ය.
(5) ස්ටැෆිලොකොකස් (*Staphylococcus*) විශේෂ ය.

6. ගැඹුරු තෙලේ බදින ලද ආහාර නුසුදුසු තත්ත්ව යටතේ ගබඩා කිරීම නිසා ඒවායේ ඉන්ද්‍රිය ගෝචර ගුණාංග පිරිහීමට ප්‍රධාන හේතුව වනුයේ
(1) ලිපිඩ ඔක්සිකරණය නිසා දුර්වර්ණයක් ඇති වීම ය.
(2) ලිපිඩ ඔක්සිකරණය නිසා නුසුදුසු ස්වාදයක් ඇති වීම ය.
(3) නිර්වායු ශ්වසනය නිසා දුර්ගන්ධය ඇති වීම ය.
(4) එන්සයිමීය නොවන ප්‍රතික්‍රියා නිසා හටගන්නා දුඹුරු පැහැයක් ඇති වීම ය.
(5) ලිපිඩ විච්ඡේදන ක්‍රියාව නිසා වයනය මෘදුවීම ය.

7. ජාතික ආහාර නිෂ්පාදනය ප්‍රමාණවත් වුව ද, ආහාර සුරක්ෂිතතාව නොමැතිවීම පිළිබිඹු කෙරෙනුයේ
(1) කෘෂි නිෂ්පාදනවල අගය එකතුවීම සහ විවිධාංගීකරණය මගිනි.
(2) ප්‍රශස්ත තත්ත්ව යටතේ ආහාර ගබඩා කිරීම මගිනි.
(3) පාරිභෝගිකයින්ගේ අනවබෝධය හේතුවෙන් වැරදි ආහාර තෝරාගැනීම මගිනි.
(4) පාරිභෝගිකයින්හට ආහාර ළඟාකරගැනීමට ඇති හැකියාව ප්‍රමාණවත් නොවීම මගිනි.
(5) අඩු වේතන හේතුවෙන්, ගෘහ ඒකකවලට ආරක්ෂිත සහ පෝෂණීය ආහාර දැරියහැකි මිලකට ලබාගත නොහැකිවීම මගිනි.

8. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප තුනක්, කෘෂි දේශගුණික කලාප හතක් සහ කෘෂි පාරිසරික කලාප 46ක් ඇත.
(2) ශ්‍රී ලංකාවේ වියළි කලාප දැකිය හැක්කේ පහතරට සහ මැද රට පමණි.
(3) ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාපය වෙන්කර ඇත්තේ උච්ඡත්වය හා වර්ෂාපතනය පමණක් පදනම් කරගෙන ය.
(4) ශ්‍රී ලංකාවේ උඩරට කලාපය කෘෂි පාරිසරික කලාප 24 කට තවදුරටත් බෙදා ඇත.
(5) ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප වෙන්කොට ඇත්තේ වාර්ෂික වර්ෂාපතනය, උෂ්ණත්වය සහ පාංශු වර්ගය අනුව ය.

9. පාංශු පැතිකඩක, උප පස,
(1) මතුපිට පසට වඩා ශාක පෝෂකවලින් පොහොසත් ය.
(2) බොහෝ විට සමන්විත වනුයේ ජීර්ණය වූ පස් සහ මැටි ඛනිජවලින් ය.
(3) වැලි, රොන් මඩ සහ මැටිවලින් පොහොසත් ය.
(4) ක්ෂුද්‍ර ජීවී වර්ධනය පහසුකරන ස්ථරයයි.
(5) කාබනික ද්‍රව්‍ය බහුල ස්ථරයකි.

10. ස්වාභාවික ශාක අලිංගික ප්‍රචාරණ ව්‍යුහය සහ එයට අදාළ උදාහරණ ඇතුළත් නිවැරදි ගැළපීම සහිත වරණය තෝරන්න.
(1) බල්බිල - *Musa acuminata*
(2) කෝම - *Solanum tuberosum*
(3) මොරෙයියන් - *Ananas comosus*
(4) ආකන්ධ - *Ipomoea batatas*
(5) බල්බ - *Allium sativum*

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

11. බහුලව භාවිත වන බද්ධ කිරීමේ ක්‍රම කිහිපයක් පහත රූප සටහනෙහි A, B, C සහ D යනුවෙන් දක්වා ඇත. ඒවා නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.



A B C D

(1) A – කුඤ්ඤ බද්ධය, B – මුට්ටු බද්ධය, C – ජිහ්වා බද්ධය සහ D – ආරුක්කු බද්ධය
(2) A – මුට්ටු බද්ධය, B – ජිහ්වා බද්ධය, C – ආරුක්කු බද්ධය සහ D – කුඤ්ඤ බද්ධය
(3) A – ජිහ්වා බද්ධය, B – මුට්ටු බද්ධය, C – ආරුක්කු බද්ධය සහ D – කුඤ්ඤ බද්ධය
(4) A – ආරුක්කු බද්ධය, B – කුඤ්ඤ බද්ධය, C – මුට්ටු බද්ධය සහ D – ජිහ්වා බද්ධය
(5) A – ජිහ්වා බද්ධය, B – ආරුක්කු බද්ධය, C – කුඤ්ඤ බද්ධය සහ D – මුට්ටු බද්ධය

12. ක්ෂුද්‍ර ප්‍රචාරණයේදී පූර්වකය ජීවානුහරණය කිරීම සඳහා යොදාගත **නොහැකි** ක්‍රමය වනුයේ
(1) 0.5% පොලිවයිනයිල්පයිරොලිඩෝන් (PVP-40) ද්‍රාවණයේ මිනිත්තු 10 ක් ගිල්වා තැබීමෙනි.
(2) 5% සෝඩියම් හයිපොක්ලෝරයිට් ද්‍රාවණයේ මිනිත්තු 20 ක් ගිල්වා තැබීමෙනි.
(3) 3.25% කැල්සියම් හයිපොක්ලෝරයිට් ද්‍රාවණයේ මිනිත්තු 30 ක් ගිල්වා තැබීමෙනි.
(4) 70% එතිල් ඇල්කොහොල් ද්‍රාවණයේ මිනිත්තු 2 ක් ගිල්වා තැබීමෙනි.
(5) 1% සිල්වර් නයිට්‍රේට් ද්‍රාවණයේ මිනිත්තු 10 ක් ගිල්වා තැබීමෙනි.

13. ඖෂධීය ශාක ගබඩා කිරීම සඳහා වඩාත් සුදුසු සාපේක්ෂ ආර්ද්‍රතා පරාසය (RH) වනුයේ
(1) 10% – 20%. (2) 30% – 40%. (3) 50% – 60%. (4) 70% – 80%. (5) 90%–100%.

14. හීන් බිංකොහොඹ (the Green Chiretta)
(1) කාෂ්ඨීය කඳන් සහිත ශාකයකි.
(2) ප්‍රධාන සක්‍රිය සංයෝගය ලෙස කර්කියුමින් නිපදවයි.
(3) 'කිංග් ඔෆ් බිටර්ස්' (King of Bitters) ලෙස පොදුවේ හඳුන්වයි.
(4) පත්‍ර පමණක් පාරම්පරික වෛද්‍ය ක්‍රමයේ භාවිත වේ.
(5) ශ්‍රී ලංකාවට ආවේණික වේ.

15. ඒකාවේරිය (Ekaweriya),
(1) 'සර්පගන්ධ' ලෙස ද හැඳින්වේ.
(2) මුල් පමණක් පාරම්පරික වෛද්‍ය ක්‍රමයේදී භාවිත වේ.
(3) වර්ධනයට සෘජු සූර්යාලෝකය අවශ්‍ය වේ.
(4) ආහාරයට ගතහැකි ඵල නිපදවයි.
(5) ලවණ සහිත වෙරළ ආශ්‍රිත ප්‍රදේශවල හොඳින් වර්ධනය වේ.

16. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේදී 'මස්බැද්ද' (Masbedda) ශාකයෙහි මූලික වශයෙන් යොදාගන්නා කොටස වනුයේ
(1) පත්‍ර ය. (2) මුල් ය. (3) රයිසෝම ය. (4) මල් ය. (5) බීජ ය.

[හතරවැනි පිටුව බලන්න

17. ආහාර ද්‍රව්‍ය වියළීමේ ප්‍රධාන අරමුණ වනුයේ
(1) ගබඩා කාලය දිගු කර ගැනීම ය.
(2) ආහාරවල දෘඪභාවය ඇති කිරීම ය.
(3) ස්වාදය වැඩි දියුණු කිරීම ය.
(4) බර අඩු කිරීම ය.
(5) පෝෂක පරිරක්ෂණය කිරීම ය.

18. 'පැස්ටරීකරණය'
(1) කිරි සඳහා පමණක් සුදුසු වේ.
(2) ව්‍යාධිජනක ක්ෂුද්‍ර ජීවීන් විනාශ කරයි.
(3) කිරි දිගු කාලයක් ගබඩා කිරීම සඳහා යෝග්‍ය වේ.
(4) කිරිවල මේදය වෙන්කිරීමේ ක්‍රියාවලියකි.
(5) කිරි සමාජාතිකරණය කරයි.

19. පහත ප්‍රකාශ සලකන්න.
*A* - පටක රෝපණය මගින් කෙසෙල් පැළ ප්‍රචාරණය කිරීම සාම්ප්‍රදායික ජෛව තාක්ෂණ ක්‍රමයකි.
*B* - බතලගොඩ වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මගින් මෑතකදී බිහිකරන ලද නව වී ප්‍රභේද නවීන ජෛව තාක්ෂණයේ ප්‍රතිඵලයකි.
*C* - ශාකයකට නව ගුණාංග හඳුන්වාදීම සඳහා ශාක සෛලයක අඩංගු ජාන විකරණය කළ හැක.
ඉහත ප්‍රකාශ/ය අතුරෙන් නිවැරදි වන්නේ
(1) *A* පමණි.
(2) *B* පමණි.
(3) *C* පමණි.
(4) *A* සහ *B* පමණි.
(5) *A* සහ *C* පමණි.

20. ව්‍යවසායකයකු
(1) සිය ව්‍යාපාර සගයන් මත දැඩිව යැපේ.
(2) ආත්ම විශ්වාසයෙන් සහ අවබෝධයෙන් යුක්ත වේ.
(3) නම්‍යශීලීවීමට නොව ස්වාධීනවීමට උත්සාහ කරයි.
(4) සෑම විට ම නම්‍යශීලී වන අතර අනුනට සවන් දෙමින් අන් අයගේ උපදෙස් මත යැපේ.
(5) ආයෝජනයට අවශ්‍ය තරම් ප්‍රාග්ධනය සතු පුද්ගලයකු වේ.

21. 'ශදුඅත' (SWOT) විශ්ලේෂණයක් සාමාන්‍යයෙන් කෙරෙනුයේ
(1) ව්‍යාපාරයක ප්‍රගතිය ඇගයීමට ය.
(2) නිෂ්පාදන නැඹුරු ව්‍යාපාරයක් සේවා නැඹුරු ව්‍යාපාරයකින් වෙන්කර හඳුනාගැනීමට ය.
(3) නව ව්‍යාපාරික ක්‍රියාවක යෝග්‍යතාව සහ විභවය හඳුනාගැනීමට ය.
(4) ව්‍යාපාරයක වාර්ෂික ආදායම් ඇස්තමේන්තු කිරීමට ය.
(5) සමාජයට ව්‍යාපාරික ක්‍රියාවක ඇති බලපෑම ඇගයීමට ය.

22. ව්‍යාපාරයක 'මුදල් ප්‍රවාහ ප්‍රකාශය' වැදගත් වනුයේ
(1) ව්‍යාපාරයේ මුදල් ශේෂය සොයා ගැනීමට ය.
(2) ව්‍යාපාරයේ ලාභදායී බව සොයා ගැනීමට ය.
(3) ව්‍යාපාරයේ දළ ආදායම සොයා ගැනීමට ය.
(4) මුළු වත්කම්වල වටිනාකම සොයා ගැනීමට ය.
(5) මුළු නිෂ්පාදන පිරිවැය සොයා ගැනීමට ය.

23. පහත ව්‍යාපාරික අවස්ථා සලකන්න.
*A* - මගී ප්‍රවාහන සේවාව
*B* - ගඩොල් නිෂ්පාදනය
*C* - පැළ තවානක් පවත්වාගෙන යාම
ඉහත ඒවා අතුරෙන් ප්‍රාග්ධන සූක්ෂ්ම ව්‍යාපාරයක්/ව්‍යාපාර වනුයේ
(1) *A* පමණි.
(2) *B* පමණි.
(3) *C* පමණි.
(4) *A* සහ *B* පමණි.
(5) *B* සහ *C* පමණි.

[පස්වැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

24. මෘදු තාක්ෂණික නවෝත්පාදනයක ව්‍යාපාරික අයිතිය නෛතිකව ආරක්ෂා වනුයේ
   (1) දේපළ අයිතිවාසිකම් මගින් ය.
   (2) බුද්ධිමය දේපළ අයිතිවාසිකම් මගින් ය.
   (3) මූලික අයිතිවාසිකම් මගින් ය.
   (4) මානව හිමිකම් මගින් ය.
   (5) පුද්ගලික දේපළ අයිතිවාසිකම් මගින් ය.

25. කාර්යක්ෂම ජීව වායු නිෂ්පාදනයක pH පරාසය සහ කාබන්:නයිට්‍රජන් (C/N) අනුපාතය අතර ප්‍රශස්ත අගයන් වනුයේ
   (1) pH 5.5–6.5 සහ C/N අනුපාතය 25:1 වේ.
   (2) pH 6.5–7.5 සහ C/N අනුපාතය 30:1 වේ.
   (3) pH 7.0–8.5 සහ C/N අනුපාතය 25:1 වේ.
   (4) pH 7.5–8.5 සහ C/N අනුපාතය 35:1 වේ.
   (5) pH 6.0–6.5 සහ C/N අනුපාතය 35:1 වේ.

26. කුඹුරුවල කෘමි පාලනය සඳහා සාම්ප්‍රදායික ක්‍රමයක් වන්නේ
   (1) ජලය බැඳ තැබීම ය.
   (2) වැඩි බීජ ප්‍රමාණයක් වැපිරීම ය.
   (3) 'දිය හොල්මන (water ghost)' භාවිත කිරීම ය.
   (4) නියරවල මඩ තැබීම ය.
   (5) රසායනික කෘමිනාශක යෙදීම ය.

27. රූපයේ දැක්වෙන යන්ත්‍රය වඩාත් සුදුසු වන්නේ



   (1) බිම් සකස් කිරීමට ය.
   (2) බිම මට්ටම් කිරීමට ය.
   (3) වැටි සෑදීමට ය.
   (4) කෘෂිකාර්මික ඉඩම් සඳහා ජලය පොම්ප කිරීමට ය.
   (5) අස්වැන්න නෙළීමට ය.

28. උස්බිම් වගාව සඳහා සුදුසු රෝද හතරේ ට්‍රැක්ටරයට සවිකර ඇති ප්‍රාථමික බිම් සකස් කිරීමේ උපකරණය වනුයේ
   (1) රොටිවේටරය ය.
   (2) තැටි පෝරුව ය.
   (3) තැඩ ලැලි නගුල ය.
   (4) කොකු නගුල ය.
   (5) අතුරුයත්ගෑමේ උපකරණය ය.

29. ජලය රඳා පැවතීම සුලබ වන්නේ
   (1) බෑවුම් සහිත ඉඩම්වල ය.
   (2) වැලි පසක ය.
   (3) කාබනික ද්‍රව්‍ය බහුල පස්වල ය.
   (4) මැටි පසක ය.
   (5) භූ ජල මට්ටම ගැඹුරු වූ භූමියක ය.

30. 'SALT' යනු
   (1) උස්බිම් වගාවේ වල් පැළෑටි පාලනය කරන ක්‍රමයකි.
   (2) පාංශු ඛාදනය පාලනය කරන ක්‍රමයකි.
   (3) සුළං බාධකයකි.
   (4) වාරි ජල සම්පාදන ක්‍රමයකි.
   (5) ගොවිපළ ක්‍රමයකි.

31. මැටි බඳුන් ජල සම්පාදනය සුදුසු වන්නේ
   (1) වාණිජ එළවළු වගාවට ය.
   (2) කුඩා පරිමාණයේ පලතුරු උයන්වලට ය.
   (3) මහා පරිමාණයේ පොල් වගාවට ය.
   (4) වී වගාවට ය.
   (5) හරිතාගාර සඳහා ය.

**32.** කේන්ද්‍රාපසාරී පොම්පයක් සහිත ජලය පොම්ප කරන පද්ධතියක පාදස්ථ කපාටය (foot valve) සවිකළ යුත්තේ

(1) බෙදාහැරීමේ නළයේ කෙළවරට ය.
(2) ජල පොම්පයේ චූෂණ ඇසට (suction eye) ය.
(3) චූෂණ නළයේ මැදට ය.
(4) චූෂණ නළයේ මුලට ය.
(5) ජල පොම්පයේ බෙදාහැරීමේ ඇසට (delivery eye) ය.

**33.** භූගත ජලයේ විද්‍යුත් සන්නායකතාව (electrical conductivity) මගින් දක්වන්නේ

(1) ආම්ලිකතාවය ය.
(2) ජලයේ අවලම්බිත අංශු ප්‍රමාණය ය.
(3) ජලයේ ආවිලතාවය (turbidity) ය.
(4) ජලයේ දිය වී ඇති අයන හෝ ලවණ ප්‍රමාණය ය.
(5) පානීය ජලය සඳහා ගුණාත්මකභාවය ය.

**34.** ඔක්සිකරණය වූ තත්ත්ව යටතේ පසට යූරියා යොදන විට බොහෝ දුරට සිදුවිය හැකි ක්‍රියාවලිය වන්නේ

(1) යූරියා ඇමෝනියා වායුව බවට පරිවර්තනය වීම සහ වාෂ්පීකරණය මගින් එය අහිමි වීම ය.
(2) අධික ලෙස ද්‍රාව්‍ය වන බැවින් යූරියා වේගයෙන් කාන්දු වීම ය.
(3) යූරියේස් එන්සයිමයේ ක්‍රියාකාරිත්වය මගින් යූරියා ඇමෝනියම් කාබනේට් බවට ජල විච්ඡේදනය වීම ය.
(4) යූරියා නයිට්‍රජන් වායුව බවට නයිට්‍රිහරණය වීම ය.
(5) පරිවර්තනයකින් තොරව ශාක මගින් යූරියා සෘජුව ම අවශෝෂණය කර ගැනීම ය.

**35.** පහත ප්‍රකාශ සලකන්න.

*A* - සෘජු පොහොරවල එක් ශාක පෝෂකයක් පමණක් අඩංගු වන අතර මිශ්‍ර පොහොරවල ශාක පෝෂක එකකට වඩා අඩංගු වේ.
*B* - යූරියා යනු 46% ක නයිට්‍රජන් අඩංගු ජලයේ ද්‍රාව්‍ය සෘජු පොහොරකි.
*C* - ඉහළ උෂ්ණත්ව තත්ත්ව යටතේ යූරියාවල නයිට්‍රජන් ඇමෝනියා ලෙස නිදහස් විය හැක.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ

(1) *A* පමණි. (2) *B* පමණි. (3) *A* සහ *B* පමණි.
(4) *B* සහ *C* පමණි. (5) *A*, *B* සහ *C* සියල්ල ම.

**36.** පහත ප්‍රකාශ සලකන්න.

*A* - ප්‍රභාසංශ්ලේෂණය මගින් ආලෝක ශක්තිය රසායනික ශක්තිය බවට පරිවර්තනය කරයි.
*B* - පොස්පරස්, ශාකවල ධාන්‍ය පිරීමට සෘජුව ම දායක වේ.
*C* - ශාකවල මුල් වර්ධනය වීම කෙරෙහි පොටෑසියම් සෘජු බලපෑමක් ඇති කරයි.

ඉහත ප්‍රකාශ අතුරෙන්

(1) *A* පමණක් නිවැරදි ය. (2) *B* පමණක් නිවැරදි ය.
(3) *A* සහ *B* පමණක් නිවැරදි ය. (4) *B* සහ *C* පමණක් නිවැරදි ය.
(5) *A*, *B* සහ *C* යන සියල්ල නිවැරදි ය.

**37.** ශාක පටක රෝපණය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) එය ක්ෂුද්‍ර ප්‍රචාරණ තාක්ෂණයකි.
(2) පටක රෝපණය කළ ශාකවල විකෘති ඇති නොවේ.
(3) පටක රෝපණය කළ ශාක ක්ෂණික පාරිසරික වෙනස්කම්වලට ඔරොත්තු දෙයි.
(4) පටක රෝපණය භාවිතයෙන් නව ශාක නිපදවීමට සියලු ම ශාක කොටස් භාවිත කළ නොහැක.
(5) පටක රෝපණය කළ ශාක සෑම විට ම අනෙකුත් ශිල්පීය ක්‍රම මගින් ප්‍රචාරණය කළ ශාකවලට වඩා හොඳ වර්ධනයක් පෙන්නුම් කරයි.

PAST PAPERS WIKI

[කන්වැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**38.** නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) බෝග නිෂ්පාදන පද්ධතියක දක්නට ලැබෙන බෝගය හැර අනෙකුත් සියලු ම ශාක වල් පැළෑටි ලෙස හැඳින්වේ.

(2) සියලු ම තෘණ සහ පන් වර්ගයේ වල් පැළෑටි ඒකබීජ පත්‍රී වේ.

(3) ද්විබීජ පත්‍රී වල් පැළෑටිවල තන්තු මූල පද්ධතියක් ඇත.

(4) වාර්ෂික වල් පැළෑටි ලිංගික සහ අලිංගික ක්‍රම මගින් ප්‍රචාරණය වේ.

(5) වර්ධක ප්‍රචාරණය වන වල් පැළෑටි පහසුවෙන් පාලනය කළ හැකි ය.

**39.** වයිරසයක් නිසා ඇතිවන රෝගයක් වන්නේ

(1) මිරිස්වල දියමලන් කැම ය.

(2) පලතුරුවල ඇන්ත්‍රැක්නෝස් ය.

(3) කෙසෙල් වද පීදීම ය.

(4) එළවළුවල පත්‍ර පුල්ලි ඇතිවීම ය.

(5) තක්කාලි මෘදු කුණුවීම ය.

**40.** කෘමියකු **නොවන** පළිබෝධකයකු වනුයේ

(1) පලතුරු මැස්සා ය.

(2) මයිටාවා ය.

(3) දුඹුරු පැළ කීඩෑවා ය.

(4) සුදු මැස්සා ය.

(5) ගොයම් මැස්සා ය.

**41.** ශාක ප්‍රචාරකයක නිවැරදි කාර්යය තෝරන්න.

(1) බීජ පැළවීම සඳහා අවශ්‍ය අඳුරු පරිසරයක් නිර්මාණය කරයි.

(2) ඉහළ වාෂ්පීකරණ උත්ස්වේදනයක් සඳහා සාපේක්ෂ ආර්ද්‍රතාවය අඩු කරයි.

(3) නිසි වර්ධනය සඳහා ශාක ආතතිය වැඩි කරයි.

(4) දඬු කැබලි මුල් ඇද්දවීමට උපකාරී වන පාලිත පරිසරයක් නිර්මාණය කරයි.

(5) ශාක වර්ධනය වැඩි කිරීම සඳහා ඔක්සිජන් මට්ටම වැඩි කරයි.

**42.** වාණිජ පරිමාණයෙන් පොලිතින් උමගක තක්කාලි වගා කිරීම සඳහා වඩාත් සුදුසු වගා ක්‍රමය තෝරන්න.

(1) පාවෙන ස්ටයිරෆෝම් සහිත හයිඩ්‍රොපොනික් වගාව.

(2) නිර්පාංශු වගාව.

(3) අතින් ජලය සපයන කොම්පෝස්ට් පිර වූ වගා මලුවල වගා කිරීම.

(4) ස්වයංක්‍රීය වාරි ජල සම්පාදනය සහ පොහොර යෙදීම සහිත වගා මලුවල වගා කිරීම.

(5) බිංදු ජල සම්පාදනය සහිත හරිතාගාර තුළ ස්වාභාවික පසෙහි වගා කිරීම.

**43.** අපනයනය කිරීමේදී කැපූ මල්වල ගුණාත්මය පවත්වා ගැනීම සඳහා වැදගත් ම සාධකය වන්නේ

(1) සියලු ම මල් වර්ගවල පොහොට්ටු ඒවායේ මුල් අවධියේදී ම නෙළීම ය.

(2) සිසිලන හානි වළක්වා ගැනීම සඳහා කාමර උෂ්ණත්වයේ මල් ගබඩා කිරීම ය.

(3) නැව්ගත කිරීමේදී තෙතමනය රඳවා ගැනීම සඳහා වායුරෝධක ප්ලාස්ටික් බෑග් භාවිත කිරීම ය.

(4) අස්වැන්න නෙළීමේ සිට ගමනාන්තය දක්වා ශීත දාමය පවත්වා ගැනීම ය.

(5) ඇසුරුම් කිරීමට පෙර මල්වලට ජලය ඉසීම ය.

**44.** ඇන්තූරියම් සහ රෝස සඳහා බහුලව භාවිත කරන ප්‍රචාරණ ක්‍රම වන්නේ පිළිවෙළින්

(1) කඳ කැබලි සහ බීජ ප්‍රචාරණය ලෙස ය.

(2) පටක රෝපණය සහ අංකුර බද්ධය ලෙස ය.

(3) රයිසෝම කැබලි කිරීම සහ අතු බැඳීම ලෙස ය.

(4) මොරෙයියා සහ දැඩි දඬු කැබලි භාවිතය ලෙස ය.

(5) පාදස්ථ රිකිලි සහ බීජ භාවිතය ලෙස ය.

45. රෝමාන්තික සතුන් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ඔවුන්ට විශාල සරල ආමාංශයක් ඇත.

(2) ඔවුන්ට විශාල සංකීර්ණ ආමාංශයක් ඇත.

(3) රූමනයේ ජීවත් වන ක්ෂුද්‍ර ජීවීන්ගේ උපකාරයෙන් ඔවුන් තම ආහාර ජීර්ණය කරන බැවින් ඔවුන්ට ජීර්ණක එන්සයිම අවශ්‍ය නොවේ.

(4) ඔවුන්ගේ ආමාංශය අභ්‍යන්තරව සමාන කොටස් හතරකට බෙදී ඇත.

(5) රෝමාන්තික නොවන සතුන් හා සසඳන විට, ඔවුන්ට සම්පූර්ණයෙන් ම වෙනස් ජීර්ණ පද්ධතියක් ඇත.

46. අනෙකුත් කිකිළියන්ට සාපේක්ෂව බිත්තර දමන කිකිළියන් සඳහා අධිකව අවශ්‍ය විශේෂිත පෝෂකය වනුයේ

(1) මෙතයනින් ඇමයිනෝ අම්ලය ය.
(2) අත්‍යවශ්‍ය මේද අම්ල ය.
(3) කැල්සියම් ය.
(4) වර්ණක ය.
(5) විටමින් D ය.

47. බිත්තර රක්කවීමේ ක්‍රියාවලිය පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.

*A* - කිකිළි බිත්තර දින 21 ක් රක්කවිය යුතු ය.

*B* - බීජෝෂණ සමයේදී බිත්තර හැරවීම සිදුකරනුයේ ඒවායේ රක්කවීමේ හැකියාව වැඩි කිරීමට ය.

*C* - බිත්තර රක්කවීමේදී කුකුළු කළලයේ නිසි වර්ධනය සඳහා අවශ්‍ය වැදගත් ම සාධකය උෂ්ණත්වයයි.

ඉහත ප්‍රකාශ අතුරෙන්

(1) *A* නිවැරදි නමුත් *B* සහ *C* වැරදි ය.

(2) *B* නිවැරදි නමුත් *A* සහ *C* වැරදි ය.

(3) *C* නිවැරදි නමුත් *A* සහ *B* වැරදි ය.

(4) *A* සහ *C* නිවැරදි වන අතර, *B* වැරදි ය.

(5) *A*, *B* සහ *C* යන සියල්ල ම නිවැරදි ය.

48. බීජෝෂණය සඳහා, තෝරාගත් බිත්තර පමණක් භාවිත කළ යුත්තේ

(1) බිත්තර සඵලතාවය වැඩි කිරීමට ය.

(2) බිත්තර රක්කවීමේ හැකියාව වැඩි කිරීමට ය.

(3) බිත්තර රක්කවනයක සනීපාරක්ෂක තත්ත්වයන් පවත්වා ගැනීමට ය.

(4) දිනක් වයසැති කුකුළු පැටවුන්ගේ ඒකාකාර රැළක් ලබා ගැනීමට ය.

(5) කුකුළු පැටවුන්ගේ මරණ අනුපාතය අඩු කිරීමට ය.

49. එළදෙනකගේ මද චක්‍රය අදියර හතරකින් සමන්විත ය. එම අදියර හතර නිවැරදි අනුපිළිවෙළින්

(1) මදය, පෙර මදය, පසු මදය සහ මද අතුර වේ.

(2) පෙර මදය, මදය, පසු මදය සහ මද අතුර වේ.

(3) මද අතුර, පෙර මදය, පසු මදය සහ මදය වේ.

(4) මද අතුර, පෙර මදය, මදය සහ පසු මදය වේ.

(5) පෙර මදය, මද අතුර, මදය සහ පසු මදය වේ.

50. මානව ඛනිජ අවශ්‍යතා සලකා බැලීමේදී, එළකිරි වැදගත් වනුයේ

(1) Na ප්‍රභවයක් ලෙස ය.
(2) K ප්‍රභවයක් ලෙස ය.
(3) P ප්‍රභවයක් ලෙස ය.
(4) Ca ප්‍රභවයක් ලෙස ය.
(5) Fe ප්‍රභවයක් ලෙස ය.

* * *

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න